**ශීර්ෂ 130 - පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා අමාත්‍යාංශයේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ ශිර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

## 1.1 විගණන විෂය පථය

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 ජූලි 20 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් සහ සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම්

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 11,112.24 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිගියන 9,517.43 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 1,594.81 ක් හෙවත් සියයට 14.4 ක් ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 1,583.94 | 1,273.87 | 310.07 | 19.6 |
| මූලධන | 9,528.30 | 8,243.56 | 1,284.74 | 13.5 |
| **එකතුව** | **11,112.24** | **9,517.43** | **1,594.81** | **14.4** |

### 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 13001 | 8.00 | 6.47 | 3.90 | 4.74 | 35.00 | 24.99 |

2.3 විගණන නිරීක්ෂණය

------------------------

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණ ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3.1 ඡේදයේ සිට 3.10 ඡේදය දක්වා වූ ඡේදවල සඳහන් කර ඇත.

**3. ශීර්ෂ 130 - පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය**

**---------------------------------------------------------------**

**3.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම**

**---------------------------------------------**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (i) | ලැබෙන චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය සඳහා වූ ලේඛනය | මුදල් රෙගුලාසි 451 |
| (ii) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය |
| (iii) | කමිටු රැස්වීම් වාර්තා | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3(අ) මාර්ගෝපදේශය |
| (iv) | ලංසු කැඳවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය |

3.2 විසර්ජන ගිණුම

------------------

(අ ) අයවැය විචලනය

---------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

වැය විෂයයන් 34 ක් සඳහා රු.1,482,023,498 ක අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන්

ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 6 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ආ) **වෙනත් අමාත්‍යාංශ විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

ප්‍රවේශ මාර්ග සංවර්ධනය හා ග්‍රාමීය පාලම් නවීකරණය හා අළුතින් ඉදිකිරීම සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් එකතුව රු.මිලියන 4,395 ක ප්‍රතිපාදන පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයට ලබා දී තිබුණි. එම ප්‍රතිපාදනවලින් රු.මිලියන 1,903 ක් උපයෝජනය කර තිබුණි. එම ප්‍රතිපාදන උපයෝගී කරගෙන අංගන ඉදිකිරීම ඇතුළු බහුවිධ කාර්යයන් සඳහා ගැල්වනයිස් බට මිලදී ගත යුතු බවට පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්වරයාගේ 2014 ඔක්තෝබර් 09 ,15 හා 20 දිනවල දැනුම් දීම මත රු.44,347,822 කට ගැල්වනයිස් බට 40,056 ක් මිලදී ගෙන තිබුණි. එම ගනුදෙනුව පිළිබඳව සිදු කරන ලද විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 මාර්ගෝපදේශයේ සඳහන් අරමුණු ඉටුවන පරිදි ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කළ යුතු වුවත්, එසේ නොවන පරිදි ඉහත සඳහන් ප්‍රසම්පාදනය විවෘත තරඟකාරී ලංසු කැඳවීමේ පරිපාටිය අනුගමනය නොකර 2014 ඔක්තෝබර් 28 දින සිට නොවැම්බර් 14 දින දක්වා කාලය තුළ රු.44,347,822 ක ප්‍රසම්පාදනය අවස්ථා 6 කට කොටස් කර වෙළඳපළ මිල සැඳහුම් ක්‍රමය මඟින් මිලදීගෙන තිබුණි.

(ii) ගැල්වනයිස් බටවල පිරිවිතර තීරණය කිරීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුවෙන් හෝ ඒ සම්බන්ධයෙන් දැනුමක් ඇති නිලධාරියෙකුගෙන් හෝ සහතිකයක් ලබා නොගෙන කොඩි කණු සඳහා පමණක් භාවිතා කළ හැකි ගැල්වනයිස් බට සඳහා මිල ගණන් කැඳවා තිබුණි.

(iii) පළාත් පාලන ආයතනවලින් කොඩි කණු අවශ්‍යතාවය පිළිබඳ ලිඛිත ඉල්ලීමක් කර නොතිබුණු අතර, දිස්ත්‍රික්ක 9 ක පළාත් පාලන ආයතන 77 කට රු.44,347,822 ක කොඩි කණු 40,056 ක් ලබා දී තිබුණි. මෙසේ ලබා දී තිබුණු කොඩි කණු අදාළ පළාත් පාලන ආයතන විසින් කිසිදු ඵලදායි කාර්යයක නොයොදවා එම ආයතනවල ගොඩ ගසා තිබුණු බව පළාත් පාලන ආයතනවල නියැදියකින් 2015 ජනවාරි 28 දිනැති ලිපියකින් කැඳවන ලද තොරතුරු අනුව සනාථ විය.

3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය
---------------------------------------------------------------------------

විෂය අංක 13001 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දින විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,244,434 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ මාස 06 ක සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට සතුටුදායක ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**3.4 අනුකූල නොවීම්**
--------------------

**නීති , රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**
-------------------------------------------------------

ප්‍රාදේශීය සභා අටකට ලබා දුන් එකක් රු.30,210 ක් වූ රු.1,419,870 ක් වටිනා ජංගම කුටි 47 ක ප්‍රමාණය මුදල් රෙගුලාසි 751 ප්‍රකාරව අමාත්‍යාංශයේ තොග ලේඛනයේ ඇතුළත් කළ යුතු වුවත්, 2014 දෙසැම්බර් 31 දින වන විටත් එසේ කර නොතිබුණි.

**3.5 විදේශ ආධාර ව්‍යාපෘති**
--------------------------

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් විදේශ මූල්‍යාණය යටතේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 11 හි ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 76,257 ක් වූ අතර එම ව්‍යාපෘති වෙනුවෙන් රු. මිලියන 3,326 ක් උපයෝජනය කර තිබුණි. 2015 ජූනි 30 දින වන විට විගණනය කරන ලද විදේශාධාර ව්‍යාපෘති 06 ක් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) මහ කොළඹ අප ජල කළමනාකරණ ව්‍යාපෘතිය**
-------------------------------------------------------

වනාතමුල්ල ප්‍රදේශයේ ඉදිකිරීම් සහ වැඩිදියුණු කිරීම් සඳහා 2014 ජනවාරි 13 දින රු.මිලියන 290 කට කොන්ත්‍රාත්තුව පිරිනමා 2015 ජනවාරි 27 නිම කිරීමට සැලැසුම් කර තිබුණත්, එම දිනය ඉක්මවා 2015 පෙබරවාරි 19 දින වන විටත් එහි භෞතික ප්‍රගතිය සියයට 13 ක් වී තිබුණි.

(ආ) පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය
--------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ව්‍යාපෘතිය විසින් විධිමත් ශක්‍යතා අධ්‍යයනයක් නොකර රු.29,827,931 ක් වැය කර මිලදී ගෙන තිබුණු කාපට් අතුරන යන්ත්‍රය (Asphalt Premix Paving

Machine) මධ්‍යම පළාත් සභාවේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත 2013 දෙසැම්බර් මාසයේ දී ලබා දී තිබුණි. එම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් එම යන්ත්‍රය ලබා දුන් දින සිට විගණන දිනය වූ 2015 මැයි 21 දිනය වන විටත් එම යන්ත්‍රය දින 05 ක් පමණක් සේවයේ යොදවා තිබුණි.

(ii) ව්‍යාපෘතිය විසින් සබරගමුව පළාත් සභාවේ සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරියට ලබා දුන් රු.24,306,303 ක් වටිනා ටිපර් රථ 08 ක් හා රු.9,950,858 ක් වටිනා Double Drum Steel Wheel Roller 08 ක කාර්යඵල අවම තත්ත්වයක පැවතුණි.

(iii) ව්‍යාපෘතිය විසින් සබරගමුව පළාත් සභාවේ පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවට රු.2,940,499 ක් වැයකර ලබා දුන් පැතලි ලෙලෙන යන්ත්‍ර (Plate Compactors) 15 ක් හා රු.703,999 ක් වටිනා තණකොළ කපන යන්ත්‍ර 16 ක් විගණන දිනය වූ 2015 මැයි 12 දින වන විටත් කිසිදු ඵලදායි කටයුත්තක යොදවා ගෙන නොතිබුණි.

(iv) 2015 මාර්තු 15 දින අවසන් කිරීමට නියමිත SG2KG3 මාර්ග පැකේජයේ ප්‍රගතිය 2015 ජූනි 30 දින වන විට සියයට 73 ක් හා SG3RP1 මාර්ග පැකේජයේ ප්‍රගතිය සියයට 46 ක ඉතා දුර්වල මට්ටමක පැවතුණි.

(ඇ) මාර්ග ක්ෂේත්‍ර සහායක ව්‍යාපෘතිය
-------------------------------------
පහත සඳහන් කරනු ලැබේ.

(i) ව්‍යාපෘති හා අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ පිළිවෙළින් නිලධාරින් තිදෙනෙකු හා 39 දෙනෙකු ඇතුළත් නිලධාරින් 42 ක් සහභාගී වූ මත්තල චාරිකාවට කටුනායක සිට මත්තල දක්වා ගුවන් ටිකට්පත් ලබා ගැනීමට හා ආහාර පාන සඳහා රු.479,250 ක් ව්‍යපෘති මුදලින් වැය කර තිබුණි.

(ii) ග්‍රාමීය මාර්ග නියමු සංරචකයේ ව්‍යාපෘති කාර්යයන් 2014 සැප්තැම්බර් 30 දින අවසන් වුවද, එම ව්‍යාපෘතිය අවසන් කිරීමේ වාර්තාව 2015 මාර්තු 31 දින වන විටද රේඛීය අමාත්‍යාංශයට භාරදී නොතිබුණි.

(ඇ) පළාත් මාර්ග ව්‍යාපෘතිය (ඌව)

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2013 සැප්තැම්බර් 01 දිනැති අංක Sec/2013/07 දරන දේශීය ආදායම් දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 06 වන වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා නිලධාරින් 9 දෙනෙකුගේ රු.421,704 ක උපයන විට ගෙවීමේ බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි.

(ii) ඌව පළාත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය විසින් ව්‍යාපෘති නිලධාරින්ගේ භාවිතය සඳහා චාරිකා නිවාසයක් UVA ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුගෙන් ලබා ගෙන එම නිවස සඳහා වූ කුලිය ප්‍රමාණපත්‍රවලට ඇතුළත් කර 2014 වර්ෂයේදී රු.1,635,891 ක් ගෙවා තිබුණි.

(iii) ලංසු නිවැරදිව ඇගයීම මඟින් නිවැරදි කොන්ත්‍රාත්කරුවෙකු තෝරා නොගැනීම හා කොන්ත්‍රාත් කොන්දේසි කඩකළ UVA 02 ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුගේ ගිවිසුම අවලංගු නොකිරීම නිසා රු.මිලියන 729 ක අලාභ ඉල්ලා කොන්ත්‍රාත්කරු විසින් බේරුම්කරණ නඩුවක් 2014 අගෝස්තු 05 දින ගොනුකර තිබුණි. එමගින් රජයට ඇතිවිය හැකි මූල්‍යමය අලාභය නවතා ගැනීමට කළමනාකරණය විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද මේ සම්බන්ධව 2014 මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(iv) ප්‍රසම්පාදන කාල සටහන අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීම, ව්‍යාපෘති අධීක්ෂණ උපදේශක හා ව්‍යාපෘති කාර්යය මණ්ඩලය පත්කර නොතිබීම හා ඌව පළාත් සභාව හා මුදල් අමාත්‍යාංශය අතර මූල්‍ය ගිවිසුම් අත්සන් නොකිරීම වැනි හේතු නිසා ලංසු ලැබීමෙන් පසු ලංසු වලංගු කාල සීමාව ඇතුළත ඇගයීම් සිදුකර කොන්ත්‍රාත්තුව ප්‍රදානය නොකිරීම නිසා ලංසුකරුවන් 05 දෙනෙකුට කොන්ත්රාත් වටිනාකමින් ස්ථිර කොටස මත සියයට 6 කට සමාන රු.18,626,657 ක් ගෙවා තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන උපදේශකවරුන් දෙදෙනෙකු පත්කර තිබියදීත් ඉහත සඳහන් ගැටළු ඇතිවී තිබුණි.

(v) ව්‍යාපෘතිය විසින් උපදේශකයින් හා ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සඳහා වාහන 25 ක සේවය කොන්ත්‍රාත්කරුවන් මඟින් ලබා ගෙන ඒ සඳහා රු. මිලියන 149.8 ක කුලියක් ගෙවා තිබුණි. එම වාහන කොන්ත්‍රාත්කරුගෙන් සපයා ගැනීම වෙනුවට වාහන 25 ක් රු.මිලියන 110.6 කට මිලදී ගත්තේනම් දළ වශයෙන් රජයට

රු.මිලියන 20.5 ක මූල්‍යමය වාසියක් හා රු.මිලියන 110.6 ක් වටිනා වාහන 25 ක අයිතියද හිමි කර ගැනීමට තිබුණු අවස්ථාව අහිමි කර ගෙන තිබුණි.

(vi) බදුල්ල දිස්ත්‍රික්කයේ ඉදිකළ UVA 02 - ගල උඩ කන්දකැටිය මාර්ගයේ 4+730 ස්ථානයේ බෝක්කුවක් 900 mm පළලට ඉදිකර තිබුණු නමුත් 600mm පළලට ඉදිකළ පැරණි බෝක්කුව ඉවත්කර නොතිබුණි. මෙම ස්ථානයේ වාරිමාර්ග පද්ධතියට මාර්ග ඉදිකිරීම් හේතුවෙන් හානි සිදුවී තිබුණද එය යථා තත්ත්වයට පත් කර නොතිබීම හේතුවෙන් ගොවීන් 18 කට අයත් අක්කර 36 ක වී ගොවිතැන් සඳහා ජලය ලබා ගැනීමේ ගැටළු මතු වී තිබුණි.

**(ඉ) පළාත් මාර්ග ව්‍යාපෘතිය(ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය)**

---

ව්‍යාපෘතියේ වියදමින් විදේශ අධ්‍යයන හෝ පුහුණුව සඳහා අවස්ථා 4 කදී නිලධාරීන් 9 දෙනෙකු විදේශගත වී තිබුණි. 2010 ඔක්තෝබර් 11 දිනැති අංක 2010/01 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව අනියම් දීමනාව ලෙස දිනකට එක්සත් ජනපද ඩොලර් 30 ක් ගෙවිය යුතු වුවත්, ව්‍යාපෘතිය විසින් එම නිලධාරීන්ට අනියම් වියදම් දීමනාව ලෙස දිනකට එක්සත් ජනපද ඩොලර් 50 බැගින් ගෙවීම නිසා රු.140,405 ක් වැඩිපුර ගෙවා තිබුණි. එසේ වැඩිපුර ගෙවා තිබුණු මුදල 2014 දෙසැම්බර් 31 දින වන විටත් ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ඊ) උතුරු මාර්ග සම්බන්ධ කිරීමේ ව්‍යාපෘතිය (අතිරේක ප්‍රතිපාදන)**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කළ මාර්ග පැකේජයන් 05 කට අදාළ ගෙවීම්වලින් රු.90,142,929 ක් රඳවා ගෙන තිබුණි. එම රඳවාගත් මුදල සමාලෝචිත වර්ෂය අවසානයට පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු බැරකමක් ලෙස දක්වා නොතිබුණි.

(ii) ආසියානු සංවර්ධන බැංකුව සමඟ ශ්‍රී ලංකා රජය විසින් අත්සන් කරන ලද අංක 2890 දරන ගිවිසුම අනුව, ව්‍යාපෘති අරමුදලින් වාහන මිලදී ගැනීමට ප්‍රතිපාදන සළසා නොතිබුණි. නමුත් ව්‍යාපෘතිය විසින් පැකේජ 01 කොන්ත්‍රාත්කරු හරහා කොන්ත්‍රාත්තුවේ වියදමට රු.17,000,000 ක් ඇතුළත් කර අර්ධ සුඛෝපභෝගී කැබ් රථ 02 ක් මිලදී ගෙන තිබුණි.

(iii) ව්‍යාපෘති අරමුදලින් මිලදී ගත් ඉහත වාහන දෙකෙහි නඩත්තු වියදම් ලෙස 2014 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරු වෙත රු.2,136,000 ක් ගෙවා තිබුණි.එම නඩත්තු වියදම්වලට අදාල බිල්පත්, දෛනික ධාවන සටහන් කිසිවක් ව්‍යාපෘති කාර්යාලය විසින් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. මේ නිසා එම වියදම් විගණනයේදි සතුටුදායක ලෙස සංනිරික්ෂණය කිරිමට නොහැකි විය.

(iv) ව්‍යාපෘති කාර්යාලයට අනුයුක්ත නිලධාරීන් 10 දෙනෙකුට ඔවුන්ගේ මූලික වැටුපට ගෙවිය යුතු සියයට 5 ක විශේෂ දීමනාව, සියයට 15 ක දීමනාව හා ව්‍යාපෘති කාර්යාලයේ සේවය කිරීම වෙනුවෙන් ගෙවන සියයට 50 ක දීමනාවද පදනම් කරගෙන ව්‍යාපෘතියෙන් එම නිලධාරින්ට වැටුප් ගෙවීම නිසා සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.158,940 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(v) ව්‍යාපෘති කාර්යාලයේ රාජකාරි ආවරණය කිරීමට පත්කර සිටි උතුරු මැද පළාත් රාජ්‍ය සේවා නිලධාරීන්ට තම නිත්‍ය තනතුරට අදාළ වැටුප් ගෙවීමේදී සියයට 5 ක විශේෂ දීමනාව හා සියයට 15 ක දීමනාව ගෙවා තිබුණි. එසේ ගෙවා තිබියදී ව්‍යාපෘතිය විසින්ද කාර්යාලයේ රාජකාරි ආවරණය කිරීම වෙනුවෙන් ගෙවනු ලබන දීමනා සඳහාද ඉහත සඳහන් සියයට 5 ක විශේෂ දීමනාව හා සියයට 15 ක දීමනාව ගෙවා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘති අරමුදලින්ද එම දිමනා ලෙස එකතුව රු.220,368 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(vi) වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ උපදෙස් හා අවසරය ලබා නොගෙන අනුරාධපුර ප්‍රදේශයේ ඉදිකර තිබූ වැව් බැමි හරහා වැටී ඇති මාර්ගයන්හි මාර්ග තලය විධිමත් පරිදි කාපට් කිරීම සඳහා වැව්බැමි කැපීම, පස් පිරවීම හා තැලීම සිදු කර තිබුණි. මේ නිසා වැව්බැමි හරහා සංවර්ධනය කර තිබූ මාර්ගවල කාපට් කරන ලද මාර්ග තලය පුපුරා තිබුණි. (උදා-NCANC -128 කිරිගොල්ලෑව - හිරලුගම මාර්ගයේ 3+750km, 6+540 km පළමු හා දෙවන වැව් ආශ්‍රිත කොටස් පුපුරා තිබුණි).

**3.6 කාර්යසාධනය**

------------------

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) 2014 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් දේශීය අරමුදල් ව්‍යාපෘති සම්බන්ධ දත්තවල මූල්‍යමය ඉලක්කයන් පමණක් සඳහන් කර තිබුණු අතර භෞතික ඉලක්කයන් දක්වා නොතිබුණි. මේ හේතුවෙන් ආයතනයේ සැලැසුම් කටයුතු සාර්ථක වී නොතිබුණි.

(ආ) ප්‍රගති වාර්තාවේද අමාත්‍යාංශයේ මූල්‍ය ඉලක්කයන් හා මූල්‍ය ප්‍රගතිය පමණක් සටහන් කර තිබුණි. මේ නිසා අමාත්‍යාංශය විසින් ඉටු කළ සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් භෞතික ප්‍රගතිය දක්වා නොතිබුණි. එම තොරතුරු අදාළ ලිපිගොනු පරීක්ෂාවෙන්ද ලබා ගැනිමට නොහැකි විය.

**3.7 අවිධිමත් ගනුදෙනු**

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාපටිපාටියෙන් බැහැර වීම.**

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 මාර්ගෝපදේශයට පටහැනිව පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය විසින් පිරිවැය රු.මිලියන 24.77 ක් වූ ජංගම කුටි 820 ක් වෙළඳපල මිල සැදහුම් ක්‍රමය උපයෝගී කරගෙන මිලදී ගෙන පළාත් පාලන ආයතන අතර බෙදා දී තිබුණි.

**3.8 පාඩු හා හානි**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන වෙත කැනපි කුටි 120 ක් බෙදා දී තිබුණු අතර නියැදි විගණන පරීක්ෂාවේදී එසේ බෙදා දුන් බව සඳහන් රු.864,000 ක් වටිනා කැනපි කුටි 32 ක් අදාළ පළාත් පාලන ආයතන 6 ක් වෙත ලැබී නොතිබුණි.

**3.9 කළමනාකරණ දුර්වලතා**

අම්පාර දිස්ත්‍රික්කයේ දිළිඳු ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමට ස්වයං රැකියා අවස්ථා ඇති කිරීමට මැතිවරණ කාල සීමාව තුළ පාපැදි 900 ක් රු.13,305,600 කට මිලදී ගෙන 2015 ජනවාරි 05 දින අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාවට භාරදී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පෞද්ගලික ආයතනයක් වෙතින් රු.13,305,600 ක් වැය කර බයිසිකල් 900 ක් මිලදී ගෙන තිබුණි. එම ප්‍රසම්පාදනයේදී අවම ලංසුව හා ඊට පසු අඩුම ලංසුව යන ලංසු දෙකම ප්‍රතික්ෂේප කර තිබිම නිසා පිළිවෙලින් රු.939,600 ක් හා රු.759,600 ක මූල්‍යමය අවාසියක් රජයට සිදු වී තිබුණි.

(ii) 2014 දෙසැම්බර් 31 දින ලියන ලද චෙක්පත් අතරින් පාපැදි 900 සඳහා රු.13,305,600 ක චෙක්පත පමණක් නිකුත්කර තිබූ අතර භෞතික පරික්ෂාවේදී නිරික්ෂණය වූයේ 2014 දෙසැම්බර් 31 දින ලියන ලද වටිනාකම රු.16,262,375 ක් වූ චෙක්පත් 04 ක් 2015 ජනවාරි 13 දින වන විටද ගිණුම් අංශයේ පැවති අතර 2015 ජනවාරි 16 දින වන විට ඒවා අවලංගු කර තිබුණි.

**3.10 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 39 | 26 | 14 | 01 |
| (ii) | තෘතියික මට්ටම | 03 | 01 | 02 | |
| (iii) | ද්විතියික මට්ටම | 153 | 120 | 33 | |
| (iv) | ප්‍රාථමික මට්ටම | 55 | 42 | 13 | 01 |
| (v) | වෙනත් (අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 01 | - | - |
| | **එකතුව** | **250** | **190** | **62** | **02** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 62 ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණු අතර අතිරික්ත සේවකයින් දෙදෙනා සඳහා විධිමත් අනුමැතියක් ලබා ගැනීමට 2014 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.